කොළඹ විශ්වවිද්‍යාලය

2018 ජූනි 14

ප්‍රිය ශිෂ්‍යා/ ශිෂ්‍යාවනි,

**<u>උපාධි ප්‍රදානෝත්සවය - 2017</u>**
**<u>(දෙවන දිනය - 2018 ජූලි 25)</u>**

කොළඹ විශ්වවිද්‍යාලයෙහි උපාධි ප්‍රදානෝත්සවය **2018 ජූලි මස 24 සහ 25** යන දෙදින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවෙහි දී (BMICH) පැවැත්වීමට නියමිත බැව් මෙයින් දන්වා සිටිමි. 2018 ජූලි මස 25 වන දින පහත සඳහන් පරිදි සැසිවාර දෙකකදී උපාධි ප්‍රදානෝත්සවය පැවැත්වෙනවා ඇත.

**2018 ජූලි 25** බදාදා

| සැසි වාරය | වේලාව | පීඨය/මණ්ඩපය/අධ්‍යයන ආයතනය |
|---|---|---|
| I වන සැසි වාරය | පෙ.ව. 08.00 | නීති පීඨය සහ කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක පාසල |
| II වන සැසි වාරය | ප.ව. 01.30 | වෛද්‍ය පීඨය සහ විද්‍යා පීඨය |

(2018.07.24 යන දින උපාධි ප්‍රදානය කරනු ලබන උපාධිධාරීන් වෙත වෙනත් ලිපියක් නිකුත් කරනු ලැබේ.)

1. උපාධි ප්‍රදානෝත්සවයෙහි නියමිත සැසිවාරයෙහි දී ඔබට අදාළ උපාධිය පිරිනැමීම සඳහා විශ්වවිද්‍යාලයෙහි කුලපතිතුමා අභිමුඛයට ඔබ ඉදිරිපත් කෙරෙනු ඇත.

2. ඔබගේ උපාධි ලෝගුව සහ පළඳනාව **2018 ජූලි මස 19, 20 හා 21** යන දිනයන්හි **පෙ.ව. 9.00 සිට ප.ව.4.00** දක්වා 94, මුනිදාස කුමාරතුංග මාවත, කොළඹ 03 යන ලිපිනයෙහි පිහිටි විශ්වවිද්‍යාලයෙහි විද්‍යාල මන්දිරයේ සාමාන්‍ය පාලන අංශයෙන් ඔබ විසින් ලබා ගත යුතුය. **උපාධි ලෝගුව ලබා ගැනීම සඳහා ඔබ විසින් පහත ලියකියවිලි ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.**

    1. ශිෂ්‍ය හැඳුනුම්පත හෝ පිළිගත හැකි වෙනත් අනන්‍යතා සහතික පතක්.
    2. නිසි පරිදි සම්පූර්ණ කරන ලද මේ සමග අමුණා ඇති ප්‍රකාශ පත්‍රය.
    3. **ඔබ විසින් ගෙවන ලද උපාධි ප්‍රදානෝත්සව ගාස්තුව සඳහා බැංකුව විසින් නිකුත් කරන ලද මුදල් තැන්පතු පතෙහි පිටපත.** (උපාධි ප්‍රදානෝත්සව ගාස්තුව ලෙස රු.**2,500/=** ක මුදලක් ඔබ විසින් ඕනෑම **<u>මහජන බැංකු ශාඛාවකින් තිඹිරිගස්යාය ශාඛාවේ පවතින කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන රැස්කිරීමේ ගිණුමට බැර කළ යුතු අතර ඒ සඳහා 1091 4000 0003 දරන අංකය භාවිතා කරන්න. (මුදල් තැන්පත් කිරීමේදී මහජන බැංකුවේ මුදල් තැන්පතු පත භාවිතා කරන්න)</u>**

3. මේ සමඟ අමුණා ඇති ඉල්ලුම් පත්‍රය නියමිත පරිදි පුරවා **<u>ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ විභාග, කොළඹ විශ්වවිද්‍යාලය, 94, කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ 03 යන ලිපිනයට වහාම ආපසු එවිය යුතුවේ. සහතික පත් පිළියෙල කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය අත්‍යවශ්‍ය බැවින් එය නියමිත වේලාවට ඉදිරිපත් නොකිරීම සහතික පත් නිකුත් කිරීම ප්‍රමාද වීමට හේතු විය හැකිය.</u>** (දැනටමත් මෙම ඉල්ලුම් පත්‍ර භාර දී ඇති සිසුන් නැවතත් එවීම අවශ්‍ය නොවේ.) මෙම අයදුම් පත්‍රය සම්පූර්ණ කර එවීමට අපොහොසත් වන සිසුන්ගේ උපාධි සහතිකයෙහි විශ්වවිද්‍යාලයට ලියාපදිංචි වීමේදී භාවිත කළ නම සඳහන් කරනු ලබන අතර එය කිසිදු හේතුවක් මත වෙනස් කරනු නොලැබේ.

4. ඔබ අයත් වන සැසි වාරයට සහභාගි වීම සඳහා **<u>අමුත්තන් දෙදෙනෙක් වෙනුවෙන් ප්‍රවේශ පත්‍ර 02 ක්</u>** ඔබ වෙත ලබා දෙනු ඇත. 2018 ජූලි මස 25 වන දින පැවැත්වෙන සැසිවාර දෙකේදී උපාධිය ලබන උපාධිලාභීන් සහ අමුත්තන් පහත දැක්වෙන වේලාවන්හිදී බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පිවිසුම් දොරටුව අභියස රැස්ව සිටිය යුතුය.

| | |
|---|---|
| **පළමු සැසිවාරය** | **- පෙ.ව .08.00** |
| **දෙවන සැසිවාරය** | **- ප.ව. 01.30** |

.... 2/-

**විශේෂ සටහන**

උපාධි පෙරහැර සකස් වීමෙන් පසු පැමිණෙන උපාධිලාභීනට උපාධි ප්‍රදානෝත්සවයේදී උපාධි ලැබීම සඳහා ඉදිරිපත් වීමට ඉඩදෙනු නොලබන බැව් කරුණාවෙන් සලකන්න.

5. රැස්වීම් ශාලාවෙහි ප්‍රධාන දොරටුවෙන් ඔබ ශාලාව වෙත ඇතුළු කරනු ලබන අතර, ඔබහට වෙන්කර ඇති අංකයෙහි අනුපිළිවෙල අනුව ඔබ සඳහා වෙන් කර ඇති ආසනයෙහි අසුන් ගත යුතුය. ඔබට අයත් අංකය උපාධි ප්‍රදානෝත්සවය සඳහා ඔබ වෙත නිකුත් කළ පොතේ සඳහන්ව ඇත. ඔබ අයත්වන මණ්ඩපයෙහි මණ්ඩපාධිපති/පීඨයෙහි පීඨාධිපති/අධ්‍යයනායතනයෙහි අධ්‍යක්ෂ විසින් ඔබගේ නම කියවීමෙන් පසු කුලපතිතුමා විසින් ඔබ වෙත උපාධිය පිරිනමනු වස් එතුමා අභිමුඛයට ඔබ ඉදිරිපත් විය යුතුය. කුලපතිතුමා විසින් ඔබ වෙත උපාධිය පිරිනැමීමෙන් පසුව ශාලාවේ පෙර සිටි අසුනෙහිම ඔබ අසුන් ගත යුතුය.

6. උපාධි ප්‍රදානෝත්සව ශාලාව තුළ ඡායාරූපගත කිරීම සිදු කිරීමට අවසර නොමැති බැව් කරුණාවෙන් සලකන්න. **කැමරා, සෙලියුලර් දුරකථන හා වෙනත් විද්‍යුත් උපකරණ ගෙන ඒමට අවසර නොමැත. වයස අවු.12 ට අඩු ළමුන් හට ශාලාව තුළට පැමිණීමට අවසර දෙනු නොලැබේ.** විශ්වවිද්‍යාලය විසින් එදිනට ඡායාරූප ශිල්පියෙකුගේ සේවාව ලබා දෙනු ලබන අතර උපාධි ලෝගුව ලබා ගැනීමට පැමිණීවිටදී එම ඡායාරූප ශිල්පියා සමඟ ඔබට අවශ්‍ය පරිදි ඔබගේ ඡායාරූපගත කිරීම සම්බන්ධව කටයුතු සැළසුම් කර ගත හැක.

7. ඔබ විසින් ලබා ගන්නා ලද උපාධි ලෝගුව සහ පළඳනාව උපාධි ප්‍රදානෝත්සවයෙන් පසු **2018 අගෝස්තු මස 03 වන දින හෝ ඊට ප්‍රථම** පෙ.ව. 9.00 සිට ප.ව.4.00 දක්වා **සාමාන්‍ය පාලන අංශය** වෙත භාරදිය යුතු වේ. නියමිත දිනය වන විට උපාධි ලෝගුව සහ පළඳනාව ආපසු භාර දීමට අපොහොසත් වන උපාධිලාභීන්ගෙන් ඒ සඳහා දිනකට **රු.100/=** බැගින් වන දඩ මුදලක් අය කරනු ලබන අතර ඒ සඳහා සතියේ දිනවල ප.ව.2.30 ට පෙර පැමිණිය යුතු වේ.

8. ඔබගේ උපාධි සහතිකය **2018 අගෝස්තු මස 27 වන දින සිට විභාග අංශයෙන්** ලබා ගත හැකිය. උපාධි සහතිකය ලබා ගැනීම සඳහා ඔබ විසින් සියලු ගාස්තු ගෙවූ බවට හා උපාධි ලෝගුව හා පළඳනාව නැවත භාර දුන් බවට සාක්ෂි වශයෙන් ලබා ගත් ලදුපත් හා කුවිතාන්සිද, ඔබගේ ශිෂ්‍ය හැඳුනුම්පත ද විභාග අංශය වෙත ඉදිරිපත් කළ යුතු වේ. **ශිෂ්‍ය හැඳුනුම්පත ඉදිරිපත් කිරීමෙන් තොරව කිසිසේත්ම උපාධි සහතිකය නිකුත් කරනු නොලැබේ.** යම්කිසි හේතුවක් මත නියමිත දිනට උපාධි සහතික නිකුත් කිරීමට නොහැකි වුවහොත් ඒ පිළිබඳව අප සමඟ සහයෝගයෙන් කටයුතු කරන ලෙස දන්වා සිටිමි.

9. **පුරුෂ පක්ෂය ජාතික ඇඳුම හෝ කොළරය හා කරපටිය සහිත බටහිර ඇඳුමෙන් සැරසී පැමිණිය යුතු අතර, කාන්තා පක්ෂය වර්ණවත් භාවයකින් යුතු සාරියකින් සැරසී පැමිණීම අපේක්ෂා කෙරේ.**

10. **සියලු දෙනාම (උපාධිලාභීන් සහ අමුත්තන් යන දෙපිරිසම) කුලපතිතුමා විසින් උපාධි ප්‍රදානෝත්සවයෙහි කටයුතු අවසන් බවට නිවේදනය කරනු ලබන තුරු තම අසුන්වලම රැඳී සිටිය යුතුය.**

11. **සීමිත ආසන ප්‍රමාණයක් පවතින බැවින් ඔබගේ අමුත්තන් නියමිත වේලාවට පැමිණ අමුත්තන් සඳහා වූ ශාලාවේ අසුන්ගත යුතු බව දැනුම් දෙමි.**

**උපාධි ප්‍රදානෝත්සවය සාර්ථකව හා ක්‍රමවත්ව කරගෙන යාම සඳහා මෙම උපදෙස් අනුගමනය කරන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමි.**

ස්තූතියි.
මෙයට - විශ්වාසී,

කේ.ඒ.එස්.එඩ්වඩ්
ලේඛකාධිකාරි

**UNIVERSITY OF COLOMBO**

14th June, 2018.

Dear Graduand,

**GENERAL CONVOCATION – 2017**
**(DAY 2 – 25th OF JULY 2018)**

I am glad to inform you that the General Convocation of the University of Colombo will be held at the Bandaranaike Memorial International Conference Hall (BMICH) on **24th & 25th of July, 2018**.The Convocation will be held in two sessions on 25th of July, 2018 as follows;

**Wednesday 25th of July, 2018**

| **Session** | **Time** | **Faculty /Institute** |
|---|---|---|
| Session I | 08.00 a.m. | Faculty of Law, University of Colombo School of Computing |
| Session II | 01.30 p.m. | Faculty of Medicine, Faculty Science |

(A separate letter is issued for the graduands who will be conferred their Degrees on 24th July, 2018.)

1. You will be presented to the Chancellor of the University of Colombo for the conferment of the Degree at the appropriate session of the Convocation.

2. You will be required to collect your cloak and garland on **19th, 20th & 21nd of July 2018 between 9.00 a.m. and 4.00 p.m.** at the General Administration Branch. "College House", 94, Cumaratunga Munidasa Mawatha. Colombo 03. In order to obtain your cloak, you should produce,

   i. **Student Identity Card or a Valid Identity Card.**
   ii. **Duly filled Declaration Form.**
   iii. **Deposit slip issued by the Bank for the payment of the Convocation fee.**
   **- Rs. 2500/=** has to be paid as the Convocation Fee to any Branch of People's Bank to be credited to the Main Collection Account number of University of Colombo at People's Bank. The reference number to be used for this purpose is **109140000003. (Bank Deposit Slip Should be used for payments)**

3. Kindly perfect and return the Supplication Form (which is attached herewith) to the Senior Assistant Registrar, Examinations Branch, University of Colombo, 94, Cumaratunga Munidasa Mawatha, Colombo 03 immediately in order to prepare your original certificate. **Failure to return the duly filled Supplication Form in time may delay the issue of degree Certificate**. (The graduands who have already submitted Supplication Form need not send again). For those who failed to submit the duly filled supplication forms, certificate will be issued according to the names used at the time of registration. Under no circumstances, the name appears in the certificate will be changed once the certificate is issued to the graduands.

4. You will also be issued **Two Guest Tickets** for the session you are scheduled to be present. Graduands scheduled for the Sessions I, & II respectively on 25th of July, 2018 and their guests should assemble at the foyer of the BMICH on the Convocation day at the time given below.

   Session I - 08.00 a.m.
   Session II - 01.30 p.m.

Contd…2/